# නිර්මාණ Nirmana

## සුබ නත්තල !

බෙත් ලෙහෙමේ සොඳුරු සටහන් සිත් තුළය
නෙත් පිනවයි සුවඳ විහිදන සෙත් මලය
ව ත් මන් පැරණි කිතු දහමේ අත් වැලය
උ ත් තම ජේසු බිළිඳුන් දිනූ නත්තලය

සි ත් තුළ ඇතොත් සිතුවිලි නැඹුරුව පවට
අ ත් හල මැනව දරුවනි නොමවනු නිවට
නත් තල සාමයේ මුව දොරටුව බවට
ප ත් වී තිබෙන බව කිවයුතු නැහැ ලොවට

නි බ දව නැගිය යුතු බැති ගී ජය නාදෙන්
සු බ නත්තලක වටිනාකම අවබෝ දෙන්
ලැබ ගනු පිණිස සැනසිලි සුව අවි වාදෙන්
ඔ බ අප වෙතට සාමයෙ දෙව්දුව ආදෙන්

ප ණ ගැන්වී තිබෙන කිතුදහමක අගය
ම න පිනවන සුළුය ඉතිහාසය දිගය
ක න බොන අහර ඇත දුරුවිය අග හිඟය
සැ න සුම සතුට සුබ නත්තල අත ළඟය

♦ අලව්වේ සිරිවර්ධන
Sri Lanka

## ආපසු ගමන්

රැකගත් ඇස වගේ පුතු හා දුව ගාවා
සැනසුම ලබන්නට යළි ලන්ඩන් ආවා
ගතකර මිහිරි යුගයක් සොම්නස් වූවා
හෙට දින නැවත යමි ලය කඳුළින් නාවා

පැටවුන් කුරුළු මෙන් නිති ඇන කොටා ගෙන
නැවතත් එක්වෙමින් සතුටින් සිනා සෙන
දුව සහ පුතාගේ සෙල්ලම් බලා ගෙන
සැනසුණු යුගය රස ගඟුලකි ගලා යන

ඒ දිනවලදි අපි එක්වී හතර දෙනා
එක බත් හැලියෙ බත කාගෙන එකට අනා
එක්වී එකට එක පැදුරක තුරුළු වුණා
ලෝ දම අනුව වෙන්වන්නට පුරුදු වුණා

පිළිසිඳගත් දිනේ සිට දුව පුතුනි ඔබ
සැනසුම් සිහින සම්පත් අප වෙතට ලැබ
වීදුරු කටු කැබලි ගල් මුල් මගට සුබ
පාවඩ මල් පියලි වැටුණා දෙපා සිඹ

අපි දරුවන් ලෙයසි අද ඔබ සලකන් නේ
දුව සහ පුතා දෙව් සැප අපහට දෙන් නේ
අද ලොව ටික දෙනයි මව්පිය ගුණ දන් නේ
පිහිටම ලැබේවා ඔවුනට දෙවියන් නේ

නිවසේ ඔබේ සැපසේ නිදහසේ සිට
වෙන්වී ගියත් දරුවනි ඔබ රැකී මට
ආසිරි සුවඳ පැතිරෙන අප හදේ සිට
පාවී හමනු ඇත ඔබ දිවි පුරා වට

♦ ප්‍රේමා සුරවීර රූපසිංහ
London E6



## නත්තල් පැතුම් !

පුංචි තරුවක් අහසෙ පායා
නැවුම්බවකින් ලොවට කීවේ
පුංචි ගවලෙන ඇතුළෙ බිහිවුණු
සාමයේ පණිවුඩයෙ රාවේ
එවන් සාමය රැගෙන මිනිසත්
වෙසින් ජේසුන් ලොවට ආවේ
පවින් මිනිසුන් මුදන්නට දෙව්
පණිවුඩය දස අතට පැවේ

සියළු සිරිලක සමග මුළුලොව
නත්තලේ සිරියෙන් දිලේවා
එවන් සිරියෙන් සියළු වැසියන්
සොයුරු පෙම් දම් නිති රකීවා
සොයුරු ප්‍රේමය තුළින් සමගිය
සාමයෙන් රට ඔද වැඩේවා
පතන සාමය එලෙස ඉටුවී
සැමට සුබ සම්පත ලැබේවා!

♦ පී මුණසිංහ Sri Lanka



## පිටරට ගිය දියණිවරුන්ට !

මේ පින් බිම ඉපිද පිනකින් සසර පැතූ
කොයි රටකට ගියත් දියුණුව පිණිස මතූ
අමතක නොකර දිනූ මව්බිම අමිල තතූ
සිංහළ බසයි බුදු දහමයි උගත යුතූ

සිංහළ දූවරුන් හෙළ පෙලපතට අයත්
දොසකට ලක් නොවී වැදගත් අයගෙ වියත්
රැකගත යුතුය විළිබිය දෙක කොතන ගියත්
ඇහු දුටු පිරිස නැතිනම් ඇද පළුදු කියත්

ඇන්දත් නොයෙක් කළිසම් හැඩ ගෙනෙන රුවේ
හෙළ ලලනකගෙ ඔය ජාතික ඇඳුම නොවේ
සාරිය ඔසරියට හුරුවනු මැනවි දුවේ
සිංහළ රටක ඇති සුන්දර ගතිය මැවේ

ඉපදුණ මව්බිමේ ජාතික හැඟුම ලැබ
රෙද්දයි හැට්ටයයි බැරිනම් නොකර හබ
විළිබිය වැසෙන සේ වසමින් ළමැද නැබ
ගව්මක් ඇන්දොතින් කොපමණ හැඩද ඔබ

බුදු පුද මෙන්ම දෙගුරුන් ළඟ හිස නැවිලී
ඇති දරුවනගෙ නැත කිසිවිට හිස ඇවිලී
ගෙදරදි හදන්නට සිංහළ රස කැවිලී
හුරුවිය යුතුය නැත කොහෙදිත් පට ලැවිලී

බත් වැංජන් පිසින විදියට ඉවුම් පිහුම්
අපටම උරුම වී පවතින ගෙතුම් මැහුම්
හුරුවිය අතර තනිවම රවුම් ගැහුම්
හොඳ නැහැ අහන්නට සිදුවෙයි බැණුම් ඇහුම්

මඟුලට මළගෙයට පන්සලට යනවිට
තිබෙනා සුදුසු ඇඳුමක් මෙරට දුවකට
ඇන්දොත් වෙන ඇඳුම් ඒ ඇඳුම විසිකොට
හොඳ නැහැ ඒක දුව කුලගොතේ සිරිතට

රටකට ගිය විටදි ඇන්දත් එරට ඇඳුම්
කළයුතු නොමැත ඔබ ඒ ඇඳුමටම පිදුම්
ආ විටෙකවත් මව්බිම වෙත ඇතිව බැඳුම්
මෙරටේ ඇඳුමකින් සැරසෙනු නැතිව රිදුම්

මොන මොන හේතු මත හෝ පිටරටක ගිහින්
එරටේ සිරිත් පොදි බැඳගෙන රැගෙන ඉහින්
උමතුව ගියොත් දැක නොමගට ඇරුණු ඇහින්
හොඳ ගතිගුණ හොයා ගන්නද කොතන ගිහින්

♦ කිව්පති පාතකඩ කුලතිලක
මහරගම Sri Lanka

## නොයනෙම් තපසට

නරකෙස් බෙහෙවින් පහලව මා හිස
වියපත්කම ලුහුබැඳ එයි පසුපස
සිහිවෙයි ජීවිතයෙහි අනියත බව
එනමුදු මට යා නොහැකිය තපසට
මඛාදේව රජතුමා ලෙසින්

සුන්දර සුකොමල යහගුණ සපිරුණ
තව බොළඳයි මා ආදර දියණිය
මහ පොත් අතරෙහි නිබඳව තනිවුණ
ඇය නොදනියි මේ ලොවේ අසත්කම්

දිවියෙහි දුක සැප සමව බෙදාගත්
මා පිය සැමියා නොමඳ සෙනෙහෙ ඇති
අන් කවරෙකු හෝ නැත ඔහු සහයට
මට නම් යාමට නොහැකිය තපසට
මඛාදේව රජතුමා ලෙසින්

♦ සේපාලිකා ජයසිංහ
Middx UK

## හඳපානට වැරදිලාය

හඳපානේ මම එද්දි
දුටුවේ නැහැ මම
අපේ ගමේ කන්තෝරුව
වැටිලා මතට
පැදුර මතට
සිතුවා මම
හොරු අරගෙන ගියාවත්ද?
මැඩම් සමග කන්තෝරුව

පාන්දරම ගොස් බැලුවා
ආ මේ තියෙන්නෙ කන්තෝරුව
අර ඉන්නේ මැඩම් නේද
හිතට මගේ ලොකු සතුටකි

අනෙ ඇත්තට
හඳපානට වැරදිලාය

♦ ෂෙල්ටන් කුරේරා
උඩදෙනිය - වැලිපැන්නගහමුල්ල
Sri Lanka

## ප්‍රාතිහාර්යය

බෝ මළුව ඇමදූ
මට හොරෙන්
පියගැට පාමුල
සිටි ඔබ දෙපල
රහත්වුණු අපූරුව!

♦ වසන්තා කුමාරි
දසනායක
කිරිඳිවැල Sri Lanka

## අප්පච්චි මම එනවා

විදුලි පුවත අද ලැබුණා
අප්පච්චී ලෙඩ ඇඳේලු
ගමට යන්න නිවාඩුවක්
ඉල්ලුවාම දෙන්න බැරිලු
අස් වුනොතින්
රස්සාවෙන්
නැතේ අතට කාසි පනං
කොහොමද ණය ටික
ගෙවන්නෙ
ඉන්න පැලෙත්
කුලිය ගෙවන්
අනේ මගේ අප්පච්චී
සමාවෙන්න දහස්වරක්
සිකුරාදා වෙනකම් මම
ඉන්නම් දුක තුරුළුකරන්

♦ චන්දන ගමගේ
කළුඅග්ගල Sri Lanka

## දේශයේ සොඳුරු ගාන්ධර්වයාණෙනි !

පහළොස්වක සඳ පැයූ විලසින්
ඔබ ආ දා
ලාංකේය මියැසි රහමඬල ම
ඒකාලෝක වුණි
ඔබේ සොඳුරු සප්ත ස්වරයෙන්

අම්මාවරුන්ගේ
නොනිමි සෙනෙහසට
පියවරුන්ගේ දිරිය ශක්තියට
සොඳුරු ආදරයේ මිහිරියාවට
හදවත වැළපෙන විරහ විලාපයට
සොඳුරු රිද්මයන් මුසු කළ ඔබ
සංසාර ගමනේ තණ්හා ආසාවන්
කිසිවිට සිත නතුවන්නට
ඉඩ නොදුන් ඔබ
සුවහස් සිසු කැළකට
පෙර මං පෙන්වා
හෙළ සංගීත රහමඬලින්
සමුගෙන ගිහින්
අප කාටත් නොකියාම

විශ්වයේ සොඳුරු මිනිසාණෙනි,
මහා ගාන්ධර්වයාණෙනි,
මේ අයුරින් සංසාරයේ
අතරමගකදී
වෙන්වී ගියද
ඔබ සදාකල් අප අතරය
මියැසි පියාණෙනි....!

♦ ප්‍රියංවදා ජයමාලි
මුවගම රත්නපුරය

## පෙම්සිරි කේමදාසට සම කෙනෙක් නැත

හෙළ සිනමාව දවටාගත් ගී යුගය
මියුලැස වුණේ ඔබ හෙළිකරගත් මගය
ප්‍රේමය යොවුන් විය මතකෙහි තිබූ අගය
ගොළු හදවතින් හද පතුලට කී වගය

නොමගිය වුවද ගුරු කුලයන් ගිය පාරේ
මියැසිය ඉහළ සිට පහළට අත නැරේ
දෙනෙතින් නොවේ හද තුළ කඳුලැලි බේරේ
තත සිඳ වැටුණි මුළු සිරිලක ගී ආරේ

අත දුන්නේය අංකුර වෙත දකින හෙට
දෙමුහුන් කළා උන් සැම ගී පදය කට
සුන්දර දසුන් සත්සර මත මවන විට
වේණතත් කුමට ඔහු අතැඟිලි සරන කොට

දැඩිමුත් විලාසය ගත හිත නොම දැඩිය
විප්ලව කළා පෙරමුණ ගෙන වම් අඩිය
වෙසෙසක් තිබේ ඔහු ළඟ හැමකට වැඩිය
මිනිසෙකි උතුම් තර නොමකරගත් මඩිය

බුදු පිරිනිවන් මංගල්‍යය දකින නෙත
තනුවෙන් මවාලිය දුහුනන් දහස් වෙත
මොනයම් මිණුම ගෙන බැලුවත් පොළව මත
පෙම්සිරි කේමදාසට සම කෙනෙක් නැත

♦ මේජර් වී. බී. කරුණාරත්න
Oxford, UK

## සිංහල සිපද

බස්සා නිදි මරයි ඌ කරන වැඩ නැතී
බල්ලා කපු කටියි ඌ වියන රෙදි නැතී
වඳුරා මහලු මුත් මිහිපිට නම් නොයතී
සිවලා සිංහ වෙස් ගත් පසුව රැවටෙතී

## දීගෙක යන මා දියණිය

මගෙ දුව තිළිණි එන මස දීගෙක යනවා
හෙළ සිරිතට අනුව හැම දෙය සිදු වෙනවා
සතුටක් සමග දුක හද තුළ රැව් දෙනවා
ඔබ ගිය පසු ගෙදර පාළුව රජ යනවා

අම්මට වගේ නැන්දම්මට සලකන් න
දුක සැප දෙකම එක විදියට විඳගන් න
පුරුදුව සිටීමෙන් සැමවිට ඉවසන් න
හැකිවේ ඔබට ජීවන මග ජයගන් න

කිසිදා දුවේ මුල අමතක කරන් නෙපා
කිසිවිට හිමිට ඉහළින් ඔබ යන්න එපා
ගැටළුව කෙබඳු වුව කලබල වෙන්න එපා
අප ඔබ ළඟයි එය අමතක කරන් නෙපා

සාමය සතුට හදවත් තුළ රැව් දේවා
හසරැළි ඔබේ මුව නිරතුරු පිබි දේවා
දිවිමග දිලෙන රන්මිණිකැට මතු වේවා
තෙරුවන් සරණ ලැබ යුග දිවි සරු වේවා

♦ අයිරින් පටබැඳිගේ
London NW2

## දුක වුනත්.......!

සඳ වුනත් මැකෙයි හිරු මතු වූවාම
ගඟ වුනත් සිඳෙයි නියඟය ආවාම
නුඹ වුනත් මෙහෙම මා තනි කෙරු වාම
මම වුනත් ඉන්නෙ කොහොමද ඉවසාම

අප වුනත් සසරෙ පෙර හමු වන්න ඇතී
පෙර වුනත් නුඹව මැකිලා යන්න ඇතී
ඒ වුනත් යළිත් අප හමුවන්න ඇතී
දුක වුනත් මමත් ඉවසා ඉන්න ඇතී

මල් වුනත් පරව අකලට යන්න ඇතී
හිරු වුනත් අවරගිර ගිලගන්න ඇතී
සිත් වුනත් තැලී පොඩිවී යන්න ඇතී
පින් වුනත් අපට මිදිවා වෙන්න ඇතී

♦ මහින්ද ප්‍රසාද් මස්ඉඹුල
ගොඩකවෙල Sri Lanka

මෙම නිර්මාණ පිටුවේ පළකිරීම සඳහා ඔබේ කවි පංති එවන්න. ඒවා කෙටියෙන් ලියන්න.



## යථාර්ථය

වියලි කතරකි
පවන ඉඳහිට හමන
පොද වැස්සකින්
තෙමාලිය නොහෙන
මැටි බඳුනකි වැටී බිඳී
කැබලි විසිරුණ
කිසි ලෙසක
යළි පිළිසකර නොවන

ඉරිතැළුණු කැඩපතකි
පිළිබිඹුව නිසි ලෙසින්
නොපෙනෙන

නිරන්ජලා මනෝහාරි
Nicosia Cyprus

## මදුරුවා

නොරිදෙන්න නොදැනෙන්න
ලේ නොබිව් පාපයෙන්
අකාලයෙ මියයන්න
කරුමය ද මුල් වුණේ

නොරිදෙන්න නොදැනෙන්න
ලේ බොන්න හැකියාව
තිබුණි නම් තිබුණේ ය
අකාලයෙ නොමියෙන්න

♦ හෙන්රි රත්නවීර
තිස්සමහාරාමය